# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## Assignment for Vacation -2020
## දේශපාලන විද්‍යාව

Name / Index No...................................................... Grade 12

- පහත ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරන්න

01. ජාතික රාජ්‍ය සඳහා ගෝලීයකරණයේ අයහපත් බලපෑම අඩංගු ප්‍රකාශය කවරේද?
    A. සංවර්ධනය වන රටවල ජාතික ආර්ථික ජගත් සංවිධාන වල පාලනයට යටත්වීම
    B. ජාතික රාජ්‍යයේ භෞමිකත්වය හා ජාතිකත්වය ද ගෝලීයකරණය හමුවේ විනාශ වී ඇත.
    C. ගෝලීය නිෂ්පාදන හා මූල්‍ය හුවමාරුව නිසා දේශීය ආයෝජන දුර්වල වී ඇත.
    D. තොරතුරු තාක්ෂණය මගින් ලෝකය විශ්ව ගම්මානයක් තරමට ආසන්න කොට ඇත.
    E. ගෝලීයකරණය පෞද්ගලීකරණයට අනුබල දෙන බැවින් රාජ්‍ය සුභසාධනය අභියෝගයට ලක් වේ.

    1.ABCD 2. ACD 3. ABCE 4. BCDE 5.ABDE

02. ගෝත්‍රික රාජ්‍යයේ ලක්ෂණයක් නොවන්නේ,
    A. ප්‍රජාව අතර පවතින චාරිත්‍රවාරිත්‍ර නීතිය ලෙස බලාත්මක කිරීම.
    B. නායකයින්ගේ දේශපාලන අධිකාරී බලය උත්පාදනය වන්නේ ජ්‍යෙෂ්ඨත්වය අනුවය.
    C. ප්‍රජාව හා ආර්ථිකය සුරක්ෂිත කිරීම ගෝත්‍ර නායකත්වයේ වගකීමකි.
    D. ප්‍රජාවේ ඒකාබද්ධතාවය පාලනය මගින් අපේක්ෂා කෙරේ.
    E. පාලනය බෙහෙවින් මධ්‍යගත ස්වරූපයක් ගත්තේය.

    1.ABCD 2. ACDE 3. ABCE 4. BCDE 5.ABDE

03. වැඩවසම් ක්‍රමයට අදාළ ලක්ෂණ හඳුන්වා දෙන්න.
    A. ආර්ථික ඉඩම් පදනම් කරගත් එකක් විය.
    B. දේශපාලන බලය විමධ්‍යගතව පැවතුණි.
    C. ආගමික වශයෙන් පාප්තුමාගේ නායකත්වය පිළිගැනුණි.
    D. සාමූහික ශිල්ප ශ්‍රේණි මෙකල ක්‍රියාත්මක විය.
    E. සමාජය පන්ති විරහිත සමාජයක් විය.

    1.ABCD 2. ACDE 3. ADCE 4. BCDE 5.ABDE

04. යටත් විජිත රාජ්‍යයන් හි කැපී පෙනෙන ලක්ෂණ නම්,

A. දේශගවේශණ යටත් විජිතයන් හි ආරම්භය කෙරෙහි තීරණාත්මක විය.
B. හමුදාව හා දේශපාලන නිලබල තන්ත්‍රයන්හි ඒකාබද්ධ බවක් දක්නට ලැබිණි.
C. ප්‍රාදේශීය පාලකයින්ට තවදුරටත් ස්වාධීනව කටයුතු කළ හැකි විය.
D. මවුරටවල් තම නිෂ්පාදනවලට අමුද්‍රව්‍ය යටත් විජිත වලින් සපයා ගත්හ.
E. ආර්ථිකය හා දේශීය වෙළෙඳපොළ ඒකාබද්ධ කරගත් නූතන ජාතික රාජ්‍ය ගොඩනැගිණි.

1.ABCD 2. ACDE 3. ABCE 4. BCDE 5.ABDE

05. පශ්චාත් යටත් විජිත රාජ්‍යයන්හි ලක්ෂණ නම්,

A. දේශපාලන පක්ෂ ක්‍රමය මිලිටරි හා නිලබල තන්ත්‍රය අභිබවා සිටියි.
B. ජාතික ගොඩනැගීම හා ආර්ථික සංවර්ධනය මෙම රටවල් මුහුණ දෙන ප්‍රබල ගැටළුවකි.
C. බහුජාතික සමාගම්වල ග්‍රහනයට මෙම රටවල් ගොදුරු වී ඇත.
D. ආණ්ඩුකරණයේ දී බහුත්වවාදය යථාර්ථයක් කිරීමට පාලකයන් අසමත්ය.
E. ජාතික රාජ්‍යයේ පැවැත්මට ගෝලීයකරණය අභියෝගයක් වී ඇත.

1.ABCD 2. ACDE 3. ABCE 4. BCDE 5.ABDE

06. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයට අදාළ ප්‍රකාශ කවරේද?

A. ජෝන් ලොක්ගේ දේශපාලන න්‍යායක් ලෙස පිළිගැනේ.
B. යුරෝපී කාර්මික ධනවාදයේ දේශපාලන ප්‍රකාශනය විය.
C. ව්‍යාවස්ථාදායකට හිමිවන්නේ මිනිසුන් විසින් ආයෝජනය කරන ලද අධිකාරී බලයයි.
D. ඇරිස්ටෝටල්ට අනුව මිනිසාගේ වේදනාව නැතිකොට යහපත උදාකිරීම ලිබරල්වාදයේ කාර්යයයි.
E. ආණ්ඩුවේ අඩුවෙන් පාලනය කරනවිට මිනිස් නිදහස උපරිම වන බවයි.

1.ABCD 2. ACDE 3. ABCE 4. BCDE 5.ABDE

07. රාජ්‍ය පිළිබඳ ලිබරල් හැඳින්වීම න්‍යායට අනුව,

A. ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමට මිනිසුන් එක්ව පිහිටුවාගත් සංවිධානයයි.
B. සෙසු සමාජ සංවිධාන අතරින් උත්තරීතර සමාජ සංවිධානය රාජ්‍ය වේ.
C. පුරවැසි අයිතීන් ආරක්ෂා කොට පවත්වාගෙන යාම රාජ්‍යයේ වගකීම වේ.
D. රාජ්‍යයට අවනත වීමෙන් ලැබෙන්නේ පුද්ගලික අභිවෘද්ධිය පමණි.
E. සමාන අවස්ථා සමාන පුරවැසියන් යන සංකල්පය රජය විසින් සහතික කළ යුතුය.

1.ABDE 2. BCDE 3. ABCD 4.ABCE 5.ACDE

08. සම්භාව්‍ය ලිබරල්වාදයට අනුව,

A. ආණ්ඩුවේ අවම පාලනය අපේක්ෂාව වීම.
B. ප්‍රාග්ධන හිමියන්ට ආර්ථික නිදහස ලබා දුන්නේය.
C. කම්කරුවන්ගේ තත්ත්වය උසස් තැනකට පත්විය.
D. නීතිය හා සාමය ආරක්ෂා කිරීම රජයට භාර විය.
E. යුරෝපා සමාජය දූෂණය වීමට හේතු විය.

1.ABBE 2. BCDE 3. ABCD 4.ABCE 5.ACDE

09. නූතන ලිබරල්වාදයේ ලක්ෂණ නම්,

A. පොදු උපයෝගීතා සේවාවන් රජයෙන් ලබාදෙයි.
B. වියදම් පියවා ගැනීමට රජය බදු පනවයි.
C. සුභ සාධන කටයුතු මෙහෙයවීම රාජ්‍ය නිලධාරීන් විසිනි.
D. රජය නීතිය හා සාමය සැලසීමෙන් නිදහස්ය.
E. සමාජවාදීන්ගේ ව්‍යාප්තිය වළක්වන ලදී.

1.ABDE 2. BCDE 3. ABCD 4.ABCE 5.ACDE

10. රාජ්‍යයේ ප්‍රභවය පිළිබඳව සමාජ සම්මුතිවාදී මතයට අනුව,

A. මිනිසා ප්‍රකෘති සමාජයේ සිට සිවිල් සමාජයට පැමිණීමෙන් රාජ්‍ය බිහිවිය.
B. ලෙනින් හා රූසෝ ජනතා ස්වාධිපත්‍ය අවධාරණය කරන ලදී.
C. හොබ්ස්ගේ ප්‍රකෘති සමාජය වඩාත් සාමකාමී එකක් විය.
D. මිනිසුන් අතර ඇතිවූ එකඟතාවයකින් රාජ්‍ය බිහි විය.
E. දේවවරම්වාදය ප්‍රතික්ෂේප වීමට මෙය ඉවහල් විය.

1.ABDE 2. BCDE 3. ABCD 4.ABCE 5.ACDE

11. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ලක්ෂණ වන්නේ,

A. ඒකීය ආණ්ඩු ක්‍රමයක් වීම.
B. ආණ්ඩුවේ බලය සංවරණය වීම.
C. නියෝජිත ආණ්ඩුකරණය.
D. දේශපාලන පක්ෂ.
E. අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

1.ABDE 2. BCDE 3. ABCD 4.ABCE 5.ACDE

12. මාක්ස් පෙන්වා දෙන ප්‍රාග් කොමිනියුනිස්ට් ලක්ෂණ නම්,

A. එය ගෝත්‍ර යුගය ලෙස හැඳින්විය හැක.
B. සාමූහික ජීවිතයක් මිනිසුන්ට උරුම විය.
C. ගෝත්‍ර නායකයා රජු ලෙස පෙනී සිටියේය.
D. නිෂ්පාදන උපකරණ නොදියුණු මට්ටමේ පැවතිණි.
E. පාරිභෝජනය සඳහා පමණක් භාණ්ඩ නිපදවීම.

1.ABCD 2. AECD 3. ABDE 4.BCDE 5.ABCE

13. රාජ්‍ය පිළිබඳ මාක්ස්ගේ හැඳින්වීමට අනුව,
    A. පෞද්ගලික දේපළ ක්‍රමය සමාජය තුළ තහවුරු වීමෙන් රාජ්‍ය ඇරඹිණ.
    B. නිර්ධන පංතිය විසින් ධනපති පංතිය සූරා කෑමට බිහි වූ යාන්ත්‍රණය රාජ්‍ය විය.
    C. නිෂ්පාදන උපකරණ හා මානව සබඳතා දියුණු වුව ද අදටත් සමාජ පංති ඇත.
    D. වහල් සමාජය තුළ ප්‍රථම පංති භේදය දැකිය හැකි විය.
    E. පරමාදර්ශී කොමියුනිස්ට් යුගයේ දී රාජ්‍ය වියැකී යයි.

1.ABDE 2. BCDE 3. ABCD 4.ABCE 5.ACDE

14. පැසිස්ට්වාදී රාජ්‍යයක රාජ්‍ය හා පුරවැසියා අතර සබඳතාවය නිවැරදිව සඳහන් ප්‍රකාශය නම්,
    A. පුරවැසියාට නැවත දේශපාලන මතවාදයක් දැරිය හැක.
    B. මාධ්‍ය පුද්ගල මතය පැසිස්ට්වාදයට උචිත ලෙස හැඩගස්වයි.
    C. ධනවාදී ආර්ථික කටයුතු රජය විසින් මෙහෙය වයි.
    D. ජාතීන් අතර සමානාත්මතාව ප්‍රතික්ෂේප කරයි.
    E. කම්කරුවා තුළ පන්ති හැඟීම වෙනුවට ජාතික හැඟීම ගොඩ නංවයි.

1.ABCD 2. AECD 3. ACDE 4.ABED 5.BCDE

15. ස්ත්‍රීවාදය දේශපාලන සාහිත්‍ය තුළ සුවිශේෂී මාතෘකාවක් වීමට හේතු වූයේ,
    A. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂතා නොසලකා හැරීම.
    B. 19 වන සියවසේ ඇමරිකානු වහල්බවට එරෙහි කාන්තාව සටන් වැදීම.
    C. යුරෝපයේ හා ඇමරිකාවේ කාන්තා අධ්‍යාපනය පැතිරීම.
    D. පිරිමින්ට වඩා කාන්තාවන් ඉහළ රැකියාවක් තෝරා ගැනීම.
    E. දේශපාලනයේ කාන්තා නියෝජනය පිළිබඳ කතිකාවක ඉදිරියට යෑම.

1.ABDE 2. BCDE 3. ABCD 4.ABCE 5.ACD

16. ඒකීය ආණ්ඩුවකට අදාළ ලක්ෂණ නම්,
    A. මධ්‍යම ආණ්ඩුවේ අධිකාරී බලයට යටත් උප රාජ්‍ය ආයතන පැවතීම.
    B. කවර අවස්ථාවකදී වුව ද උපරාජ්‍ය වලට මධ්‍යම ආණ්ඩුවෙන් ඉවත්ව යාමේ හැකියාව වීම.
    C. ව්‍යවස්ථාදායකය සමස්ත රාජ්‍යයට අදාළ නීති පැනවීම.
    D. ව්‍යවස්ථාදායකය ද්වීමාණ්ඩලික වීම අනිවාර්යය නොවීම.
    E. ආණ්ඩුක්‍රම යාන්ත්‍රණය සරල හා නව්‍ය ස්වරූපයක් ගැනීම.

1.ABCD 2. AECD 3. ACDE 4.ABED 5.BCDE

✶ පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. මැකියාවෙලී රචනා කළ කෘතිය එයින් අවධාරණය කළ ප්‍රධාන දේශපාලන සංකල්පය කුමක්ද?

I .................................................. II ..................................................

02. මාක්ස් විස්තර කළ සමාජ විකාශන අවධි දෙකක් නම් කරන්න.

I .................................................. II ..................................................

03. ආණ්ඩුවේ නායකත්වය අනුව හා ආණ්ඩුවේ සංයුතිය අනුව පාලන තන්ත්‍ර හඳුන්වන ආකාර දෙකක් ලියන්න.

I

....................................................................................................................................

II

....................................................................................................................................

04. සමාජ සම්මුති න්‍යාය තුළ හොබ්ස් සහ ලොක්ගේ අරමුණු කවරේද?

I

....................................................................................................................................

II

....................................................................................................................................

05. ධනේශ්වර ක්‍රමය බිඳ දමා සමාජවාදය ස්ථාපිත කිරීම සම්බන්ධ ප්‍රායෝගික වැඩ පිළිවෙලක් ඉදිරිපත් කළ දෙදෙනා කවුරුන්ද?

I .................................................. II ..................................................

06. කාල් මාක්ස් හා පෙඩ්‍රික් ඒංගල්ස් විසින් ඉදිරිපත් කළ කෘති 2 ක් නම් කරන්න.

I .................................................. II ..................................................

07. පහත දැක්වෙන්නේ එක්තරා දේශපාලන මතවාදයක විකාශන අවස්ථා දෙකකි. හඳුනාගෙන නම් කරන්න.

I. යුරෝපීය ධනවාදයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රභවය ලැබීය.පාලනයෙන් තොරවූ තරමට පුද්ගල නිදහස උපරිම වේ. රජයට පැවරෙන්නේ පොලිස්භටයකුගේ කාර්යයකි.

II. ධනවාදයෙන් ඇති කළ සමාජ ගැටළුවලට පිළිතුරු ලෙස ඉදිරිපත් විය. රජයට නීතිය හා සාමයට අමතරව සමාජ සුභසාධනයට ද කටයුතු කිරීමට සිදු විය.

I ..........................................................................................

II ..........................................................................................

08. පහත දැක්වෙන්නේ ස්ත්‍රීවාදය පිළිබඳ මත දෙකකි. හඳුනාගෙන නම් කරන්න.

i. කාන්තාව පිරිමින් හා සමාන තාර්කික පුද්ගලයින් බැවින් ද පිරිමින් හා සමාන සහජ කුසලතා ඇති බැවින් ද සමාන නිදහස් හා අයිතිවාසිකම් ඇයට තිබිය යුතුයි.

ii. ස්ත්‍රීවාදින් ඉල්ලා සිටින සමාන ඉඩප්‍රස්තා ලබා ගැනීමට නම් ඔවුන් වෙනම කණ්ඩායමක් ලෙස නොව වැඩ කරන පංතියේ පිරිමින් සමඟ එක්ව සිදුකරන අරගලයකින් ධනවාදී ආර්ථික ක්‍රම වෙනස් කොට කොමිනිස් සමාජයක් බිහිකළ යුතුයි.

I .................................................. II ..................................................

09. සමාජවාදී ආණ්ඩුක්‍රමයක ලක්ෂණ 2 ක් නම් කරන්න.

I ..........................................................................................

II ..........................................................................................

10. පැසිස්ට්වාදීන් උතුම් කොට සලකන කාර්යයන් දෙකක් සඳහන් කරන්න.

I .................................................. II ..................................................

## පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. ලිබරල්වාදී න්‍යාය පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කරන්න.
02. ලිබරල්වාදී රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ නම් කර පැහැදිලි කරන්න.
03. සමාජවාදී න්‍යායට අනුව ඓතිහාසික භෞතිකවාදී න්‍යායේ සඳහන් පරිදි රාජ්‍ය යුග ගණනාවක් පසුකර පැමිණ ඇත. පැහැදිලි කරන්න.
04. පැසිස්ට්වාදී රාජ්‍යයක ලක්ෂණ විස්තර කරන්න.

05. පහත සඳහන් මාතෘකා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ග්‍රීක නාගරික රාජ්‍ය
ii. පාලන තන්ත්‍ර (Regime)
iii. අවම රාජ්‍ය සංකල්පය
iv. ගෝලීයකරණය හා ජාතික රාජ්‍ය